# රාජ්‍ය සේවයේ පුරප්පාඩු 15,073ක් - බඳවා ගන්න අනුමැතිය

May 27, 2025 12:02 pm

Like 1.8M people like this. Be the first of your friends.

රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩලය කළමනාකරණය සඳහා පත්කරනු ලැබූ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබේ.

ඒ අනුව අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත්කළ නිලධාරී කමිටුව විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවන් දෙකක් මඟින් රේඛීය අමාත්‍යාංශ 18ක, පළාත් සභා 4 සහ විශේෂ වියදම් ඒකක 2ක තනතුරු පුරප්පාඩු 15,073ක් සඳහා බඳවා ගැනීමට නිර්දේශ කර ඇත.

ඒ අනුව අදාළ වාර්තා මඟින් නිර්දේශිත බඳවා ගැනීමට සිදුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබේ.